| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 7 ශ්‍රේණිය | **නාට්‍ය හා රංගකලාව** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

1. රූපවාහිනිය ශ්‍රව්‍ය මාධ්‍යයකි. ( )
2. චරිත නිරූපණයේදී චලන ක්‍රියා මෙන්ම විවිධ නාද හා හඬ අනුකරණය කර දැක්විය හැකිය. ( )
3. වැලි මිරිකා දිය පෙන්නුයේ සිරි සඟබෝ රජතුමා ය. ( )
4. ක්ෂණික නිරූපණය පෙර පුහුණුවකින් තොරව ඉදිරිපත් කරයි. ( )
5. හඬ පුහුණුව සඳහා නම් පොත, බුද්ධ ගජ්ජය වැනි ග්‍රන්ථ භාවිතා කළ හැක. ( )

- **ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

6. වර්තමානයේ බහුලව භාවිතා වන රංග භූමිය වන්නේ
   i. කරලිය
   ii. පින්තූර රාමු වේදිකාව
   iii. කමත
   iv. කවාකාර රඟමඩල
7. නාට්‍ය ගීත ගායනා කිරීමේදී,
   i. අදාල නාද මාලාවට අනුවම ගැයිය යුතු වේ
   ii. හැඟීම් ප්‍රකාශ කිරීම අනවශ්‍ය වේ
   iii. ගැලපෙන චලන දැක්විය යුතු වේ
   iv. හඬ පාලනයෙන් යුතු විය යුතු වේ
8. කතන්දරයක විශේෂ ලක්ෂණයකි
   i. වාචික අභිනයෙන් තොර වීම
   ii. බලා රස විඳීම ප්‍රධාන වීම
   iii. නළුවන් රංගනයේ යෙදීම අනිවාර්ය වේ
   iv. මුල, මැද, අග පිළිවෙලින් ඉදිරිපත් කිරීම

9. නාට්‍ය පෙළක අන්තර්ගත නොවේ

i. සංවාද
ii. රංග විධාන
iii. නාට්‍ය ගීත
iv. චරිත ලක්ෂණ

10. වේදිකාවේ නාට්‍ය පිළිබඳව රූපවාහිනී මාධ්‍යයේ විකාශනය නොවන වැඩසටහනකි

i. ඇහැට කනට
ii. දොරමඩලව
iii. රංග භූමි
iv. ආයුබෝවන්

- **නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 11. ගුවන්විදුලිය | නාටයෝපකරණ |
| 12. රංගනය සඳහා යොදා ගන්නා උපකරණකි | තේමාව |
| 13. නාාට්‍යයක මූලික අදහස | නිර්භය බව |
| 14. වේදිකා නාට්‍යයක සුවිශේෂී ලක්ෂණයකි | විද්‍යුත් මාධ්‍ය |
| 15. ජාතික වීරයන්ගේ ලක්ෂණයකි | සජීවී බව |

- **ප්‍රශ්න අංක 16 - 20 තෙක් සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(රිද්මයකට / හඬ / කය හා මනස / නාට්‍ය / ශිථිලකරණය)

16. සංවාද උච්චාරණයේදී ……………….. ප්‍රබල විය යුතුය.
17. රූපණයේ දී ……………….. අතර මනා සම්බන්ධතාවයක් තිබිය යුතුය.
18. ශාරීරික යෝග්‍යතාව සඳහා ……………….. අභ්‍යාස වල නිරත වීම සුදුසු ය.
19. ඉතිහාසයේ වැදගත් සිදුවීම් ……………….. නිර්මාණය තුළින් ඉදිරිපත් කළ හැකිය.
20. නම් පොත ……………….. අනුව කියවිය හැකිය.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

1. 'පොර බඳිමින් නෑමට නොසිතන්නේ
දුව හැපෙමින් වතුරට නොපනින්නේ
ගැඹුරු දියෙන් නෑමට නොවදින්නේ
තනිව ගොසින් නෑමට නොසිතන්නේ'

i. ඉහත කවිය උපුටාගෙන ඇත්තේ කුමන ග්‍රන්යකින්ද? එහි රචකයා කවුරුන්ද? (ල. 3)
ii. එම ග්‍රන්ථයේ එන කවි වලින් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ 03ක් ලියන්න. (ල. 3)
iii. මෙම කවියේ අර්ථය ඔබේ වචනයෙන් විස්තර කරන්න. (ල. 4)

2.

i. ආධුනික රංගන ශිල්පියෙකුට තම කුසලතා වර්ධනය කර ගැනීමට භාවිතා කළ හැකි රංග අභ්‍යාස වර්ග 03ක් ලියන්න. (ල. 3)

ii. රංග අභ්‍යාසවල නිරත වීමෙන් ශිල්පියා තුළ වර්ධනය කරගත හැකි කුසලතා 03ක් ලියන්න. (ල. 3)

iii. ඔබ සිදුකළ එක් රංග අභ්‍යාසයක් සිදුකළ අයුරු විස්තර කර ලියන්න. (ල. 4)

3.

i. ඉතිහාස කතා අධ්‍යයනයේදී ඔබ ඉගෙනගත් වීර චරිත 06ක් ලියන්න. (ල. 3)

ii. වීර චරිත සම්බන්ධ එක් කතාවක් කෙටියෙන් ලියන්න. (ල. 3)

iii. ඉතිහාස කතා ඉගෙනීම තුළින් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ 04ක් ලියන්න. (ල. 4)

4.

i. ක්ෂණික නිරූපණය යනු කුමක්ද? (ල. 3)

ii. ඔබට ක්ෂණික නිරූපණය සඳහා මාතෘකාව ලැබුණු පසු ඔබ ඊට සූදානම් වන අයුරු පියවර ලෙස ලියන්න. (ල. 3)

iii. ක්ෂණික නිරූපණය මගින් ශිල්පියාට ලැබෙන පිටුවහල විස්තර කරන්න. (ල. 4)

5.

i. පහත දී ඇති පරිසර අත්දැකීම් පාදක කොට ගෙන කුඩා නාට්‍ය පෙළක් නිර්මාණණය කරන්න.

- සිසුන් ක්‍රීඩා කරන අවස්ථාවක එක් අයෙකු අනතුරකට ලක් වීම (ල.10)